# ඉඩම් අංශයෙන් සිදු කරන රාජකාරී කටයුතු

## 1. ඉඩම් කච්චේරි

- ග්‍රාම නිලධාරී වසම් 63 ට අදාළව ග්‍රාම නිලධාරී මගින් භුක්ති විඳින ඉඩමට අදාල ඉඩම් කච්චේරි අයදුම්පත්‍රයක් ලබා ගැනීම
- මූලික පරීක්ෂණ පවත්වා වාර්ෂිකව ඉ.කො. 157 නාමලේඛණය සකස් කිරිම
- මූලික පරීක්ෂණ පවත්වා තෝරාගනු ලබන පුද්ගලයින්ගේ නාමලේඛණය ග්‍රාම නිලධාරී වසම තුල ප්‍රසිද්ධ කිරිමට ලබා දීම
- ඉඩම් පරීක්ෂාව සඳහා LCD ග්‍රාම නිලධාරීන් වෙත ලබා දීම සහ ලබා ගැනීම
- LCD වාර්තාව දකුණු පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරිම
- ඉඩම් කච්චේරි අනුමැතිය ලද පුද්ගලයින් සඳහා ඉඩම් කච්චේරි කැඳවීම් ලිපි යොමු කිරිම
- එහිදි සුදුසුකම්ලාභීන් ලෙස තේරි පත්වන පුද්ගලයින්ගේ මූලික තේරීම් ලේඛණය වසමේ ප්‍රසිද්ධ කිරිමට ග්‍රාමනිලධාරීන් වෙත ලබා දීම සහ විරෝධතා ඉදිරිපත් කිරිමට කාල සීමාවක් ලබා දීම
- විරෝධතා නොමැති නම් අවසන් තේරීම් ලේඛණය සඳහා දකුණු පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරිම
- අනුමැතිය ලද පසු ග්‍රාම නිලධාරී වසම තුළ එම ලේඛණය ප්‍රසිද්ධ කිරිමට ග්‍රාම නිලධාරීන් වෙත ලබා දීම
- නොමිලේ බලපත්‍ර ලබා දීම සඳහා තෝරාගනු ලබන පුද්ගලයින්ගේ ඉ.කො 144 A ආකෘති පත්‍ර ගෙන්වීමට කටයුතු කිරිම
- ඉඩමේ තක්සේරු වටිනාකම අයකරනු ලබන බලපත්‍ර වල ඉදිරි කටයුතු සඳහා අදාල විෂයට යොමු කිරිම

## 2.රජයේ ඉඩම් ආදායම් හා රජයේ ඉඩම් දෙපාර්තමේන්තුවලට පැවරීම

- රජයේ ඉඩම් වලට අදාල නේවාසික කෘෂිකාර්මික,වානිජ,සමිති සඳහා බදුකර සකස් කිරිම හා නිදහස් දීමනාපත්‍රසකස් කිරිම
- රජයේ ඉඩම් ආදායම් රැස්කිරිමේ කටයුතු (දීර්සකාලීන බදු , වාර්ෂික බදු ,එලදා බදු ,ගැනුම් මිල )
- රජයේ රක්ෂිත ඉඩම් සඳහා වාර්ෂික හා එලදා බදු පත්‍ර නිකුත් කිරිම
- රජයේ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු,පළාත් පාලන ආයතන සඳහා ඉඩම් පැවරීම
- රජයේ ඉඩම්වල පිහිටා ඇති විහාරස්ථාන සඳහා පූජාභූමි ඔප්පු සකස් කිරිම
- කළුගල් කැනීම් කටයුතු සඳහා වාර්ෂික අවසරපත්‍ර නිකුත් කිර

## 3.සුනාමි දීමනාපත්‍ර සම්බන්ධව රාජකාරි කටයුතු

- සුනාමි දීමනා පත්‍ර සකස් කිරිමට අදාළ කටයුතු

## 4.කළුගල් කැනීමේ බලපත්‍ර නිකුත් කිරිමේ සියලු කටයුතු

**5.හිමිකම් ඔප්පු සකස් කිරිම**

සියලුම වසම් වලට අදාල හිමිකම් ප්‍රධාන පත්‍ර සකස් කිරිමේ කටයුතු හා නිකුත් කිරිමේ කටයුතු

**6.වැලි/පස්/බොරළු කැනීම හා ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරිම**

- වානිජමය නොවන කාර්යයන් සඳහා වැලි/පස් හා බොරළුකැනීම් ප්රවාහන බලපත්‍ර නිකුත් කිරිම
- අනවසර අල්ලා ගැනීම් සම්බන්ධ ග්රාම නිලධාරී වාර්තා ලබා ගැනීම,අනවසර ලේඛණ පවත්වාගෙන යාම සහ සන්තකය ආපසු ලබාගැනීමේ පනත ක්‍රියාත්මක කිරිම.
- සියළුම නඩුගොනු සම්බන්ධ කටයුතු

**7.රජයට ඉඩම් අත්පත් කර ගැනීම**

ගම් පුළුල් කිරිම සඳහා රජයට ඉඩම් අත්පත් කර ගැනීමේදි විස්තර ප්‍රකාශ සකස් කිරිම සඳහා අවශ්‍ය තොරතුරු ප්‍රාදේශීය ලේකම්ට ලබා දීම හා එයට සහාය වීම

- අනෙකුත් අත්පත් කිරිම් වලදී 2 වගන්ති ප්‍රකාශය ප්‍රදර්ශනය කිරිම හා එය නැවත ඉඩම් අමාත්‍යාංශයට යොමු කිරිමේ වගකීම දැරීම
- විරෝධතා ලබා ගැනීම හා එම විරෝධතා අදාළ අංශ වෙත යොමු කිරිම
- මැනුම් නියෝග සකස් කිරිම හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්විම
- අත්පත් කර ගන්නා ලද ඉඩම් සම්බන්ධ අයිතිවාසිකම් කැඳවීමේ නිවේදන නිකුත් කිරිම සඳහා ප්‍රාදේශීය ලේකම්ට සහාය වීම හා ඒ පිළිබඳව ග්‍රාම නිලධාරී ගොනු සමඟ සම්බන්ධීකරණය
- වන්දි පරීක්ෂණ පැවැත්වීම සඳහා ප්‍රාදේශීය ලේකම්ට සහාය වීම හා තක්සේරු දෙපාර්තමේන්තුවට සමඟ හා ප්‍රාදේශීය ලේකම් අතර සම්බන්ධීකරණය පැවැත්වීම
- වන්දි ප්‍රතිපාදන ලබා ගැනීමේදි අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම
- රජයට අත්පත් කර ගන්නා ලද ඉඩම් සඳහා වන්දි ගෙවා තිබේද යන්න පසු විපරම් කිරිම හා ඒ පිලිබඳ ජනතාව හා ප්‍රාදේශීය ලේකම් අතර අන්තර් සම්බන්ධතා පැවැත්වීම
- රජයට අත්පත් කරගෙන වන්දි ගෙවා අවසන් ඉඩම් ඒ ඒ ආයතන නමින් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරිමේ කටයුතු ඉටු කිරිම
- ඉඩම් අමාත්‍යාංශය විසින් විවිධ අවස්ථාවලදී පනවනු ලබන නිවේදන හා නියෝග අනුව රාජකාරී කටයුතු කිරිම
- ප්‍රාදේශීය ලේකම්/සහකාර ප්‍රාදේශිය ලේකම්/පරිපාලන නිලධාරී විසින් පනවනු ලබන ඉටු කිරිමට ඔබ බැඳී සිටිම.
- බලපත්‍ර/දීමනාපත්‍ර වලට අදාල පසු කටයුතු
  - මුල් අයිතිය
  - පසු අයිතිය
  - ජීවිත භුක්තිය
- බලපත්‍ර අවලංගු කිරිමේ කටයුතු
- බලපත්‍ර/දීමනාපත්‍ර රජයට භාර ගැනීම හා අවලංගු කිරිමේ කටයුතු

- දීමනාපත්‍රවල කොන්දේසි ලිහිල් කිරිම
- දීමනාපත්‍ර නොතාරිස් ඔප්පු මගින් පැවරීම
- දීමනාපත්‍ර ඉඩම් ග්‍රාමනිලධාරී අධික්ෂණ යටතේ මැන ගැනීමට අවසර දීමට කටයුතු කිරිම
- බලපත්‍ර/දීමනාපත්‍ර ඉඩම් මිනින්දෝරු දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ මැන ගැනීමට අවසර දීමට කටයුතු කිරිම
- බලපත්‍ර හා දීමනාපත්‍රවල පවතින ඉඩම් ආරවුල් සම්බන්ධ කටයුතු කිරිම
- දකුණු පළාත් ඉඩම් කොමසාරිස් වෙතින් අනුමැතිය ලැබෙන බලපත්‍ර සකස් කිරිම හා නිකුත් කිරිම

**9.ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම**

- ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම
- ඉඩම් පරීක්ෂණ පවත්වා වාර්තා ලබා දීම
- සහකාර අධ්‍යාක්ෂක(දි.ඉ.ප) හා ප්‍රාලේ කොට්ඨාසයේ වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන සමගාමීව විෂය කටයුතු සඳහා දායක වීම
- කොට්ඨාශයේ අනිසි ඉඩම් භාවිතයන් ඉඩම් ගොඩකිරීම් හා භූමිය සම්බන්ධ ස්වාභාවික සම්පත්වල ස්ථාවරත්වයට හානිවන කටයුතු සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් සහකාර අධ්‍යාක්ෂකවරයා වෙත වාර්තා කිරිම හා ඉඩම් පරිහරණ සැලසුම්කරණයට අදාළ නිර්දේශයන් ලබා දීම